**බප/හො/මොරගහහේන මහා විද්‍යාලය**
**පළමු වාර පරීක්ෂණය - 2024**
**10 ශ්‍රේණිය - ඉතිහාසය II**

**කාලය පැය 02 යි.**

**නම/විභාග අංකය : ......................................................................**

- I කොටසේ ප්‍රශ්න අංක (i) අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- ලිවිය යුතු මුලු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.

---

## I කොටස

01)

(අ) (i) පහත සඳහන් ස්ථාන ලංකා ආකෘති සිතියමේ ලකුණු කොට නම් කරන්න.
මහවැලි ගඟ, අනුරාධපුරය, පාහියන්ගල, ගල්ඔය, මහනුවර, පේදුරුතුඩුව (ල.12)

(ii) පහත සඳහන් ස්ථාන ලෝක ආකෘති සිතියමේ ලකුණු කොට නම් කරන්න.
ඉන්දියාව, පෘතුගාලය, චීනය, අරාබිය, පෝක් සමුද්‍ර සන්ධිය, මධ්‍යධරණී මුහුද (ල.06)

(ආ) • පහත සඳහන් A , B , C, D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) (A) ශ්‍රී ලංකාව ජනාවාස කළ මානවයා කවුද ? - .......................

(B) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් මෙගස්තිනීස් ගේ කෘතිය - .......................

(C) පනාකඩුව තඹ සන්නස ලියන ලද්දේ - .......................

(D) ශ්‍රී ලංකාව සිතියමකට ඇතුළත් කළ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා - ....................... (ල.04)

• පහත *A* හා *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A



(අ) (1) **A** අක්ෂරයෙන් දක්වා ඇති මූර්තිය හඳුන්වන නම කුමක් ද?

(2) එය දක්නට ලැබෙන පූජනීය ස්ථානය කුමක් ද?

(3) මෙයින් නිරූපිත පුද්ගලයා කවරෙකු ලෙස හඳුනාගෙන තිබේද ?

(4) මෙම කලා කෘතිය ශ්‍රී ලංකාවේ කුමන රාජධානි යුගයට අයත් ද? (ල.04)

B



(අ) (1) **B** රූපයේ ඇති මෙම ගල් ගුහාව තිබෙන්නේ කොහේද ?

(2) එය කොතරම් පැරණි යැයි සැළකේද?

(3) ඉන් අනාවරණය වන තොරතුරු මොනවාද?

(4) මෙම ප්‍රදේශය අයත් වන දිස්ත්‍රික්කය කුමක් ද? (ල.04)

(02) (i) මහාවංසය ලිවීමට ආභාශය ලබාගත් ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ල.03)

(ii) දීපවංසයේ පවතින අඩුපාඩු දෙකක් සඳහන් කරන්න. (ල.04)

(iii) සාහිත්‍ය මූලාශ්‍ර වල දැකිය හැකි ප්‍රයෝජන දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(iv) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර විනාශ වන අවස්ථා තුනක් සඳහන් කර, එම මූලාශ්‍ර අප විසින් ආරක්‍ෂා කර ගත යුත්තේ ඇයි දැයි විස්තර කරන්න. (ල.06)

(03) (i) ශ්‍රී ලංකාව පිළිබඳව තොරතුරු සඳහන් දකුණු ඉන්දීය ද්‍රවිඩ ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ල.03)

(ii) පහත සඳහන් අභිලේඛන මාධ්‍යයන් හි ලේඛනයන්ට උදාහරණය බැගින් ලියන්න. (ල.04)

(a) රන් තහඩු (b) තඹ තහඩු

(c) දැව (d) ශිලා ලිපි

(iii) ඉතිහාසය ඉගෙනීම සඳහා කාසි උපයෝගී කර ගත හැකි ආකාරය විස්තර කරන්න. (ල.05)

(iv) ඉතිහාසය හදාරන්නෙකුට සෙල් ලිපි වලින් අනාවරණය කර ගත හැකි කරුණු තුනක් උදාහරණ මඟින් පැහැදිළි කරන්න. (ල.06)

(04) (i) ප්‍රාග් ඓතිහාසික යුගය යනු කුමක් ද? (ල.03)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පරිසර කලාප හතරක් නම් කරන්න. (ල.04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයාගේ ආහාර රටාව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.05)

(iv) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූවෙකු මිය ගිය විට අනුගමනය කරන්නට ඇතැයි සැලකෙන චාරිත්‍ර විධි පිළිබඳ උදාහරණ තුනක් විස්තර කරන්න. (ල.06)

(05) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න. (ල.03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා තම වාසස්ථාන තෝරා ගැනීමේ දී තම අවධානය යොමු කළ කරුණු දෙකක් ලියන්න. (ල.04)

(iii) ප්‍රාග් ඓතිහාසික මානවයා ගේ ජීවන රටාව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.05)

(iv) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ තාක්‍ෂණය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල.06)

(06) (i) පූර්ව ඓතිහාසික යුගය යනු කුමක් ද? (ල.03)

(ii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කර හඳුනා ගත හැකි කරුණු දෙකක් විස්තර කරන්න. (ල.04)

(iii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය සම්බන්ධයෙන් තොරතුරු හමුවන සූකන වර්ග දෙකක් ලියා කෙටියෙන් පැහැදිළි කරන්න. (ල.05)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ තාක්‍ෂණය පිළිබඳව කරුණු තුනක් දක්වමින් පැහැදිළි කරන්න. (ල.06)

(07) (i) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් ලියන්න. (ල.03)

(ii) පහත සඳහන් වචන වල අර්ථය ලියන්න. (ල.04)

(a) අවරණ (b) පුරකමත (c) ගහපති (d) ගමික

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනයාගේ යැපීම් ක්‍රමය කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ස්වරූපය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)


N

